# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2457/06 - 2025 ඔක්තෝබර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2025.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 03/2025**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

**ආඥාව**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2025 ඔක්තෝබර් මස 10 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයේ 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ‘අ’ උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතුවන හෝ ගෙවිය යුතුවන අවස්ථාවක නම්, එකී උපලේඛනයේ 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු නියම කර අයකළ යුතු බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| සං.ව. ශීර්ෂය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **15.15** | | | **ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ අනෙකුත් ස්ථාවර ශාකමය හෝ ක්ෂුද්‍රජීවීමය මේද හා තෙල් (ජොජෝබා තෙල් ඇතුළුව) සහ ඒවායින් ඉතිරි වූ කොටස්** | | | |
| | 1515.90 | - | අනෙකුත් : | | | |
| | 1515.90.10 | --- | ටන්ග් තෙල් සහ ඉන් ඉතිරි වූ කොටස් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 4.5% | 15% | කි. ග්‍රෑ. |
| | | --- | සහල් නිවුඩු තෙල් සහ ඉන් ඉතිරි වූ කොටස් | | | |
| | 1515.90.21 | ---- | අශුද්ධ තෙල් | (PK) නිදහස් | 20% | කි. ග්‍රෑ. |
| | 1515.90.29 | ---- | අනෙකුත් | (PK) නිදහස් | 20% | කි. ග්‍රෑ. |
| | 1515.90.90 | --- | අනෙකුත් | (PK) නිදහස් | 20% | කි. ග්‍රෑ. |

EOG 10 - 0115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.